

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

புத்தசாசனம் கலாசாரம் மற்றும் மத அலுவல்கள் அமைச்சு

Ministry of Buddhasasana Cultural and Religious Affairs

වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය

ஆண்டறிக்கையும் நிதிசார் கூற்றுக்களும்

Annual Report And Financial Statements



2022

ටවර් හෝල් රඟහල පදනම

டவர் மண்டப அரங்க மன்றம்

Tower Hall Theatre Foundation

පටුන

පිටු අංකය

1.	දැක්ම, මෙහෙවර, අරමුණ , පරමාර්ථ	1
2.	හැදින්වීම	2-3
3.	ටවර් හෝල් රහහල පදනම භාරකාර මණ්ඩලය	4-6
4.	ටවර් හෝල් රහහල පදනම සංවිධාන ව්‍යුහය	7
5.	පාලන හා සංවර්ධන අංශය	9
	a. ටවර් හෝල් රහහල පදනම ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරින්	10
	b. අනුමත කාර්ය මණ්ඩලය සහ 2022.12.31 දිනට කාර්ය මණ්ඩලය	11
	c. ඉල්ලා අස්වීම්,කොන්ත්‍රාත් කාලය අවසන් වීම්,බඳවා ගැනීම්	12
	d. පුහුණු පාඨමාලා සහභාගී වූ කාර්ය මණ්ඩලය	13
	e.රංග ශාලා නවීකරණය සහ සංවර්ධනය	13
	f.රංග ශාලා හා ශබ්දාගාර වෙන් කිරීම්	14
6.	නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන් අංශය	15
7.	2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්	16-30
8	මුදල් අංශය	31
	a. විගණකාධිපති වාර්තාව	32-44
	b. අවසන් මූල්‍ය ප්‍රකාශය	45-71
9.	ස්තූතිය	72

ටවර් හෝල් රඟහල පදනම

දැක්ම

"ශ්‍රී ලංකාවේ ජාතික නාට්‍ය මධ්‍යස්ථානය බවට පත්වෙමින් ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහිකිරීමෙහිලා පුරෝගාමී ආයතනය බවට පත්වීම"

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහිකිරීමට සහ ප්‍රවර්ධනයට දායක වෙමින් ඒ සඳහා අවශ්‍ය දැනුම යටිතල පහසුකම් සපයමින් නූතන විශ්ව නාට්‍ය හා රංගකලා භාවිතයේ නව අත්දැකීම් තාක්ෂණය සහ ඥානය නොඅඩුව ලබා ගැනීමට අවශ්‍ය නව මංපෙත් සකසා දෙමින් නාට්‍ය හා රංගකලා නිර්මාණවේදීන් දිරිගන්වමින් රටේ සංවර්ධනයට මෙන්ම මානව වර්ගයාගේ යහපත සඳහා නිර්මාණකරණයේ යෙදීමට ඔවුන් පෙළඹවීම.

අරමුණු හා පරමාර්ථ

(අ) ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ආ) රඟහල පිළිබඳ දැනුම අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම.

(ඇ) රඟහල් නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහය වීම.

(ඈ) ගීත නාට්‍ය, නැටුම් නාට්‍ය හා සංගීතය නිෂ්පාදනය කිරීමේ, ඒ පිළිබඳ පරීක්ෂණ කිරීමේ සහ ඒවා රඟදැක්වීමේ නියුතු වීම. හා ඒ පිළිබඳ අධ්‍යාපනය ලබා දීම.

(ඉ) පක්ෂග්‍රාහී දේශපාලනමය කාර්යයන් සඳහා රඟහල ප්‍රයෝජනයට නොගතයුතුවන ලෙස ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහාද සුදුසුයැයි මණ්ඩලය සලකන වෙනත් කාර්යයන් සඳහා ද ටවර් හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම,ආරක්ෂා කිරීම,පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම.

හැදින්වීම

ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම සහ ටවර් හෝල් රඟහල ජාතික රඟහලක් ලෙස ප්‍රයෝජනයට ගැනීම මුඛ්‍ය පරමාර්ථය කොට ගෙන නාට්‍ය හා රංග කලාව වෙනුවෙන් ස්ථාපිත අනෙකුත් අරමුණු හා පරමාර්ථයන් පෙරදැරි කර ගෙන 1978 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කරන ලද ටවර් හෝල් රඟහල පදනම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සභාපතීත්වයෙන් හා එතුමන් ඇතුළු නිලබලයෙන් පත්වන සාමාජිකයන් දස දෙනෙකුගෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් තුන් අවුරුදු කාලයක් සඳහා පත්කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මඟින් පරිපාලනය වේ.

ටවර් හෝල් රඟහල පදනම තම අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා සුවිශාල කාර්යභාරයක් බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන් හා එම අමාත්‍යාංශයේ ලේකම්තුමන්ගේ උපදේශකත්වය හා අධීක්ෂණය මත ක්‍රියාත්මක කරන ලදී.ඒ අනුව 2022 වර්ෂය පුරාවට වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.ඒ අතර ටවර් හෝල් ශිල්පින් සඳහා වන මාසික දීමනාව රු 7500/- බැගින් රු4,215,000/- මුදලක් වසර පුරාවට ගෙවා ඇත.

තවද ටවර් හෝල් රඟහල පදනම යටතේ පිහිටුවා ඇති 1996 වසරේ සිට ක්‍රියාත්මක කරන ප්‍රාසාංගික කලාකරුවන් සඳහා වන ජනාධිපති සුබසාධන අරමුදලින් රු 7500/- ක ජීවනාධාරය ලෙස රු .7,402,500/- ක් 2022 වසරේදී වියපත් ප්‍රාසාංගික කලාකරුවන් වෙත ගෙවා ඇත.මෙම සියලු මුදල් මෙම අරමුදල් දෙකට අයත් මුදල් රජයේ බැංකු වල ස්ථාවර තැම්පතු වල ආයෝජනය කර මාසිකව ලැබෙන පොළි මුදලින්ම ගෙවන ලදී.

මීට අමතරව වෛද්‍යාධාර,මරණාධාර, ලබා දීම් අක්ෂි සායන පැවැත්වීම්, ඇස් කණ්නාඩි බෙදාදීම්, කලාකරු අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය, යන කලාකරුවන් සඳහා සුබසාධන කටයුතු රැසක් ක්‍රියාත්මක කිරීමට හැකි විය.

ටවර් හෝල් රඟහල පදනම මඟින් ක්‍රියාත්මක කරන ලද තවත් සුවිශේෂී කාර්යක් ලෙස කලාකරුවන් දිරි ගැන්වීම හා ප්‍රේක්ෂක ජනතාව රඟහල් වෙත ආකර්ශණය කර ගැනීම අරමුණු කර ගනිමින් ''ප්‍රභාස්වර'' ප්‍රසංගයක් පැවැත්වීමට කටයුතු කරන ලදී. තවද නීතිඥ ජෝන්ද සිල්වා සියවස් ගුණ සමරුව හා නාඩගම් ගී ඇතුළත් සී.ඩී. තැටියක් එළි දැක්වීමටද හැකි වූ අතර සාම්ප්‍රදායක සිංහල නර්තනය පිළිබඳ වැඩමුළු හා පැරණි ගී ප්‍රසංග පැවැත්වීමටද හැකි විය.

තවත් සුවිශේෂී කාර්යයක් වන නාට්‍ය හා රංග කලාව උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2022 වසර තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක කල අතර දෙමළ නාට්‍ය හා රංගකලා පාසලක් යාපනය සංදිලිපායි සංස්කෘතික මධ්‍යස්ථානයේදී ආරම්භ කිරීමට මෙම වර්ෂයේදී හැකි වූ අතර සිංහල හා දමිළ නාට්‍ය පාසල් සිසුන් වෙනුවෙන් දේශණ හා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. 2021/22 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් බඳවා ගත් අතර සිසුන්ගේ

අධ්‍යයන චාරිකාව හා වසර ගණනාවක සිට පැවැත්වීමට නොහැකිව තිබූ අධ්‍යයන වර්ෂ 2014/15, 2015/16, 2016/17, 2017/18,2018/19,2019/20 සිසුන්ගේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සව පැවැත්වීමටද හැකි විය.

ජාත්‍යන්තර රංගකලා ආයතනයේ ශ්‍රී ලාංකේය නියෝජිතයා ලෙසින් ටවර් හෝල් රහඟල පදනම වසර ගණනාවක් තිස්සේ ලෝක නාට්‍ය දිනය උත්සවාකාරයෙන් සමරනු ලබයි. මෙම වර්ෂයේද මෙම උත්සවය සම්භාවනීය නාට්‍යකරුවන් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

සිංහල නාට්‍ය පිටපත් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම යටතේ ප්‍රවීණ නාට්‍යවේදිනී සෝමලතා සුභසිංහ මහත්මියගේ ''තොප්පි වෙළෙන්දා ''හා ''පුංචි අපට දැන් තේරෙයි''නාට්‍ය පිටපත් ද්විත්වය එළි දැක්වීමට හැකි විය.

අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය **ටවර් නාට්‍ය උළෙල 2023** සඳහා පූර්ව කටයුතු සංවිධානය කළ අතර ඒ සඳහා නාට්‍යකරුවන්ගේ සහභාගීත්වයෙන් මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමට හැකි විය.

කාර්ය මණ්ඩලය සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු කීපයක් අලුතින් බඳවා ගැනීමට හැකි වූ අතර කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ (මුදල්),වැඩමුලික,නඩත්තුකරු, හා රංගාලෝක ශිල්පි (සහායක) දෙදෙනෙකු බඳවා ගැනීමට හැකි විය.

ටවර් හෝල් රහඟල පදනමට 2022 වසරේදී ජාතික විගණන කාර්යාලයෙන් ලැබුණු විගණන විමසුම් සංඛ්‍යාව 23 ක් වන අතර ඒ සඳහා නියමිත කාලවාකවානුවලදී පිළිතුරු සැපයීමට හැකි විය. තවද අභ්‍යන්තර විගණන අංශයෙන් විමසුම් 05 ක් ලැබුණු අතර ඒ සඳහා ද ප්‍රමාණාත්මක පිළිතුරු ලබා දීම මෙන්ම එමගින් පෙන්වා දුන් බොහෝ අඩුපාඩු සහ මහඟැරීම් රැසක් නිවරදි කර ගැනීමටද මෙම වසර තුළ හැකි විය.

ටවර් හෝල් රහහල පදනම භාරකාර මණ්ඩලය - 2022

නිල බලයෙන් පත්වන සාමාජිකවරු

01 ටවර් හෝල් රහහල පදනමේ සභාපති/
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමා - 2019.11.21 – 2022.05.11

ටවර් හෝල් රහහල පදනමේ සභාපති/
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය
රනිල් වික්‍රමසිංහ මැතිතුමා - 2022.05.25 දින සිට - 2022.07.20

ටවර් හෝල් රහහල පදනමේ සභාපති/
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය
දිනේෂ් ගුණවර්ධන මැතිතුමා - 2022.07.20 දින සිට මේ දක්වා

02 මුදල් ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා - 2021.07.08 – 2022.04.04

මුදල් ගරු අමාත්‍ය අලි සබ්‌රි මැතිතුමා - 2022.04.04 – 2022.04.05

මුදල් ගරු අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා - 2022.05.25 දින සිට මේ දක්වා

මුදල් ගරු රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමා- - 2022.09.08 දින සිට මේ දක්වා
(මුදල් අමාත්‍යතුමන් නියෝජනය කිරීම)

03 රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍ය
ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා - 2019.11.25 – 2022.04.18

රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍ය
දිනේෂ් ගුණවර්ධන මැතිතුමා - 2022.04.18 දින සිට මේ දක්වා

04 බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය- 2020.08.12 – 2022.04.18
මහින්ද රාජපක්ෂ මැතිතුමා

ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු - 2020.08.12 – 2022.04.18
ගරු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය- - 2022.05.20 දින සිට මේ දක්වා
විදුර වික්‍රමනායක මැතිතුමා

05 අග්‍රාමාත්‍ය ලේකම්, අනුර දිසානායක මහතා - 2022.01.21 – 2022.05.12

- 2022.07.22 දින සිට මේ දක්වා

අග්‍රාමාත්‍ය ලේකම්, සමන් ඒකනායක මහතා - 2022.05.13 – 2022.07.23

06 බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා - 2022.05.09 දින ඉවත්විය.

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
සෝමරත්න විදානපතිරණ මහතා - 2022.05.24 සිට මේ දක්වා

07 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් - 2022.05.09 දින ඉවත්විය.
මහාචාර්ය කපිල සී. කේ. පෙරේරා මහතා

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් - 2022.05.24 සිට මේ දක්වා
එම්.එන්. රණසිංහ මහතා

08 ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ
ලේකම් කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ මහත්මිය

09 සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ තරණි අනෝජා ගමගේ මහත්මිය

10 කොළඹ මහ නගර සභාවේ ගරු නගරාධිපතිනී රෝසී සේනානායක මහත්මිය

11 කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් - 2022 වසරේ සිට 2022.06.22
නීතිඥ රෝෂිණී දිසානායක මහත්මිය

12 කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් - 2022.06.23 දින සිට මේ දක්වා
ජේ.එම්. හදානි ජයවර්ධන මිය

<u>ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත්කරන සාමාජිකවරු</u>
<u>(පත්වීමේ දින සිට වසර 03 ක කාලයක් සඳහා)</u>

01 ජී.ආර්.පෙරේරා මහතා
02 චරිතා ප්‍රියදර්ශනී පිරිස් මහත්මිය
03 හෂීම් ඔමාර් මහතා - 2020.01.24 - 2022.10.31
04 පාලිත සිල්වා මහතා
05 නඩරාජා කාර්තික් මහතා

මහා භාණ්ඩාගාර නියෝජනය


ජේ.ආර්.සී. ජයතිලක මහතා - 2022.02.28 - 2022.04.04 දක්වා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.ඔ.),
වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව.

එච්. හේමාල් කස්තුරිආරච්චි මහතා - 2022.04.04 – 2022.07.26
අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශය

රේණුකා කොළඹගේ මහත්මිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී, මුදල් අමාත්‍යාංශය - 2022.07.26 සිට මේ දක්වා

- ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම.

- වවුර ඔෆිස් රාජකල පදනමේ සංවිධාන ව්‍යුහය -



පාලන හා සංවර්ධන අංශය

<u>ටවර් හෝල් රඟහල පදනම</u>

ජ්‍යෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්

1. අධ්‍යක්ෂ ජනරාල්	-	ආචාර්ය ඩී.එම්.එස් දිසානායක මහතා
2. අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	-	නිපුණ දිසානායක මහතා
3.අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්)	-	(පුරප්පාඩුව පවති)
4.සහකාර අධ්‍යක්ෂ(පාලන හා සංවර්ධන)	-	(පුරප්පාඩුව පවති)
5. සහකාර අධ්‍යක්ෂ (මුදල්)	-	කසුන් දේශප්‍රිය මහතා
6. සහකාර අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභසාධන හා වැඩසටහන්)	-	චන්දන බණ්ඩාර මහතා
7. සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ)	-	(පුරප්පාඩුව පවති)
8. සහකාර අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන)	-	ආචාර්ය ෂම්මුග ෂර්මා ජයප්‍රකාශ් මහතා

අනුමත කාර්ය මණ්ඩලය හා සිටින කාර්ය මණ්ඩලය 2022.12.31 දිනට

සේවා ගණය	වැටුප් **කේත** අංකය		අංකය	තනතුරු	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	HM-2-1		1	අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
	HM-1-1		2	අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	1	1	0
			3	අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන,අධ්‍යාපන භාවැඩසටහන්)	1	0	1
	MM-1-1		4	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	1	0	1
			5	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)	1	1	0
			6	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ)	1	0	1
			7	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන කලාකරු සුභසාධන හා වැඩසටහන්)	1	1	0
			8	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන)	1	1	0
කෘතීය මට්ටම	JM-1-1		9	පරිපාලන නිලධාරී	1	1	0
			10	කළමනාකරු (රඟහල්)	3	3	0
			11	අභ්‍යන්තර විගණන නිලධාරී	1	1	0
	MA-4		12	සංවර්ධන සහකාර (අලෙවි)	1	1	0
			13	සංවර්ධන සහකාර (ගිණුම් හා මුල්‍ය)	1	1	0
			14	සම්බන්ධීකරණ නිලධාරී (පාඨමාලා)	1	1	0
			15	සම්බන්ධීකරණ නිලධාරී (වැඩසටහන් හා ප්‍රචාරණ)	1	1	0
			16	සම්බන්ධීකරණ නිලධාරී (සුභ සාධන)	1	1	0
			17	ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලක	1	1	0
ද්විතීය මට්ටම	MA-2-1		18	වැඩ මූලික සිවිල්	1	1	0
			19	තාක්ෂණික සහකාර	1	0	1
			20	ශබ්ද පරිපාලක	1	0	1
			21	පොත් තබන්නා	1	1	0
	MA-1-1		22	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	26	20	6
			23	කළමනාකරණ සහකාර (මුදල් අයකැමි)	1	1	0
			24	කළමනාකරණ සහකාර (දෙමළ භාෂිත)	1	1	0
ප්‍රාථමික මට්ටම	PL-3		25	රියැදුරු	6	4	2
			26	විදුලි කාර්මික ශිල්පී	1	1	0
			27	ශබ්ද ක්‍රියාකරු	4	1	3
			28	රංගාලෝක ශිල්පී	3	2	1
			29	නඩත්තුරු	1	1	0
	PL-2		30	රංගාලෝක ශිල්පී සහායක	3	2	1
	PL-1		31	කාර්යාල සහායක	7	4	3
			32	රංගශාලා සහායක	8	6	2
			33	පාලන මැදිරි සහායක	1	0	1
			34	රංග සේවා මැදිරි සහායක	1	1	0
			35	කෞතුකාගාර/ ලේඛනාගාර සහායක	1	1	0
			36	ශබ්ද ක්‍රියාකරු සහායක	3	3	0
			37	පොත් අලෙවිහල සහායක	1	1	0
				අනුමත එකතුව -	91	67	24

පුද්ගලික වන සේ ඇති තනතුරු - දැනට සේවයේ යෙදෙන

ද්විතියික මට්ටම ප්‍රථමික මට්ටම	MA 2-1	1	පරිගණක ක්‍රියාකරු	**1**	1	0
	PL 3	2	සම්බන්ධීකාරක (සංගීත)	**1**	1	0
	PL 2	3	කළමනාකාර සහායක	**2**	2	0
	මුළු එකතුව			**95**	**71**	***24***

2022 වර්ෂය

කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම්

නෙෂාන් ධනුෂ්ක මහතා	තාක්ෂණික සහකාර	2022-09-14 සිට 2023-09-13

ඉල්ලා අස්වීම්

නම		තනතුර	දිනය
සම්පත් පෙරේරා මහතා	-	අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, අධ්‍යාපන සහ වැඩසටහන්)	2022-02-28
දිනුක අසන්ත මහතා	-	කළමනාකරණ සහකාර	2022-01-15
ශ්‍රියාලේඛා පෙරේරා මිය	-	කළමනාකරණ සහකාර	2022-09-10
දිනූෂා තරංගනී මිය	-	කළමනාකරණ සහකාර	2022-08-12
රසිකා නිලන්ති මිය	-	රංග ශාලා සහායක	2022-12-31

බඳවා ගැනීම්

නම		තනතුර	දිනය.
කසුන් දේශප්‍රිය මහතා	-	සහකාරඅධ්‍යක්ෂ (මුදල්)	2022-09-20
දිදුල සංදීපන මහතා	-	වැඩ මූලික	2022-10-03
විරංග සංදීප මහතා	-	නඩත්තුකරු	2022-10-03
චතුර ලක්ඛන මහතා	-	රංගාලෝක ශිල්පී සහායක	2022-10-03
රන්දික තෙන්නකෝන් මහතා	-	රංගාලෝක ශිල්පී සහායක	2022-10-03

පුහුණු පාඨමාලා සඳහා සහභාගි වූ කාර්ය මණ්ඩලය

පුහුණු හා පාඨමාලාවේ නම	*කාල සීමාව*	*සහභාගී වූ ගණන*
ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන	එක්දින	සියළු කාර්ය මණ්ඩලය වෙනුවෙන්
නිවාඩු භාර නිළධාරියාගේ කාර්යභාරය හා වගකීම	එක්දින	01
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	දෙදින	01
කෞතුකාගාර පුහුණුව	සති 03	03
කාර්යක්ෂමතා කඩයිම් විභාගය පදනම් කර ගත් පාඨමාලාව	එක්දින	09

රංග ශාලා නවීකරණය සහ සංවර්ධනය

සරසවිපාය

- මරදාන එල්පින්ස්ටන් රඟහලට යාබද පිහිටා ඇති සරසවිපාය ගොඩනැගිල්ලේ waterproofing කිරීම සඳහා Sunshine engineering (pvt) Ltd ආයතනය මගින් රු 7,611,189.09 ක වියදමින් සිදු කරන ලදී.

- සරසවිපාය වහලය නවිකරණය කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් සිදු කරවා ගන්නා ලද අතර ඒ සඳහා රු 6,461,373.75 ක මුදල වැය වන ලදී.

ටවර් රඟහල

- ටවර් රඟහල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් රු 4,160,762.18 ක මුදල වැය වන ලදී.

- ටවර් රඟහලේ ඉහල තිබූ වහලය ඔසවා නවිකරණය කිරීම බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් රු 2,017,082.75 ක වියදමින් සිදු කරන ලදී.

රුක්මණි දේවි රඟහල

මීගමුව රුක්මණි දේවි කෞතුකාගාරයේ දොර ජනෙල් අළුත්වැඩියාව Dinu Construction (pvt) ltd ආයතනය මගින් සිදු කරවා ගන්නා ලද අතර ඒ සඳහා 416,308.30 ක මුදලක් වැය වන ලදි.

ටවර් හෝල් රඟහල පදනම

රංගශාලා හා ශබ්දාගාරය වෙන්කිරීම්-2022


මාසික වෙන් කිරීම් ප්‍රමාණය	මාසය.	වැඩසටහන												
		ටවර් රඟහල				එල්ෆින්ස්ටන් රඟහල				රුක්මණිදේවී රඟහල				ශබ්දාගාරය
		නාට්‍ය	ප්‍රසංග	නාට්‍ය පුහුණු	වෙනත්	නාට්‍ය	ප්‍රසංග	නාට්‍ය පුහුණු	වෙනත්	නාට්‍ය	ප්‍රසංග	නාට්‍ය පුහුණු	වෙනත්	පටිගත කිරීම්
	ජන	22	0	0	1	6	0	1	5	0	0	0	7	3
	පෙබ	1	1	0	0	12	0	1	0	0		1	6	8
	මාර්තු	4	1	1	5	12	0	4	5	0	1	1	5	5
	අප්‍රේල්	3	0	1	0	4	0	0	1	0	1	2	4	5
	මැයි	0	0	0	0	3	0	1	3	0	1	0	6	6
	ජුනි	2	0	0	1	2	1	2	1	0	0	0	4	10
	ජුලි	0	0	0	0	0	1	0	2	0	0	0	5	2
	අගෝ	9	0	0	0	2	0	0	1	0	0	0	6	2
	සැප්	4	0	0	0	3	0	4	8	1	0	2	5	5
	ඔක්	2	3	0	1	9	0	2	5	4	3	4	6	8
	නොවැ	3	17	2	0	13	0	3	4	4	1	2	7	11
	දෙසැ	2	29	0	2	13	0	8	8	2	11	8	5	6
එකතුව		**52**	**51**	**4**	**10**	**79**	**02**	**26**	**43**	**11**	**18**	**20**	**66**	**41**

නාට්‍ය ප්‍රවර්ධන කලාකරු සුභසාධන සහ වැඩසටහන් අංශය

නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභ සාධන හා වැඩසටහන් අංශය

➢ නිර්මාණවේදී ඇගයුම් උත්සවය හා නාඩගම් ගී ඇතුළත් සී.ඩී. තැටිය එළිදැක්වීම

නීතිඥ ජෝන් ද සිල්වා සූරීන්ගේ සියවස් ගුණ සමරුවට සමගාමීව නාඩගම් ගී ඇතුළත් සංයුක්ත තැටිය එළිදැක්වීමේ උත්සවය 2022.01.29 දින මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ දී පැවැත්විණි. සංගීත් නිපුන් ජයන්ත අරවින්ද හා පාරම්පරික මද්දල් වාදන ශිල්පීන් වන මහේන්ද්‍ර ගුණසිංහ සහ නන්දන ගුණසිංහ යන මහත්වරුන් මෙදින උපහාර සම්මානයෙන් පිදුම් ලැබූහ.







➢ දෙමළ නාට්‍ය හා රංගකලා පාසල පැවැත්වීම

යාපනය සංදිලිපායි සංස්කෘතික මධ්‍යස්ථානයේ දී ආරම්භ කිරීමට නියමිත දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ ප්‍රථම කළමනාකරණ මණ්ඩල රැස්වීම 2022.01.25 දින උතුරු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී පැවැත්විණි. මේ සඳහා කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් ලෙස පහත නම් සඳහන් නිලධාරීන් සහභාගී විය.

- ✓ **උතුරු පළාත් ප්‍රධාන ලේකම්, සමන් බන්දුලසේන මහතා**
- ✓ **උතුරු පළාත් අධ්‍යාපන ලේකම්, ආර්. වරදීස්වරන් මහතා**
- ✓ **යාපනය විශ්ව විද්‍යාලයේ කලා හා උපාධි අධ්‍යයන පීඨයේ හිටපු පීඨාධිපති, අරුණාචලම් සන්මුගදාස් මහතා**
- ✓ **යාපනය විශ්ව විද්‍යාලයේ ලලිත කලා අධ්‍යයන අංශයේ අංශාධිපති කේ. රතීදරන් මහතා**
- ✓ **උතුරු පළාත් සංස්කෘතික අධ්‍යක්ෂ රාජ මල්ලිකෙ ශිව සුන්දර ෂර්මා මිය**
- ✓ **යාපනය විවෘත විශ්ව විද්‍යාලයේ ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ, කේ. කන්දවේල් මහතා**
- ✓ **යාපනය පලෙ ගුරු විද්‍යාලයේ හිටපු විදුහල්පති, එස්. පද්මනාදන් මහතා**





- **දෙවර්ෂ පූර්ණකාලීන නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව (දෙමළ) සඳහා සිසුන් බඳවා ගැනීම**

දෙවර්ෂ පූර්ණකාලීන නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව (දෙමළ) හැදෑරීම සඳහා සිසුන් බඳවාගැනීමට අදාළ අයදුම්පත් භාර ගැනීම 2022.02.28 දිනෙන් අවසන් වූ අතර, සිසුන් 86 දෙනෙකු මේ සඳහා ඉල්ලුම් කර තිබුණි.

දෙවර්ෂ පූර්ණකාලීන නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව (දෙමළ) සඳහා සිසුන් බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණය 2022.03.21, 22 හා 23 දිනයන් හි යාපනය සංදිලිපායී සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. මෙහි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලෙස කේ. කන්තවේල්, සෝ. පත්මනාදන් හා ෂංමුගෂර්මා ජයප්‍රකාශ් යන මහත්වරුන් කටයුතු කරන ලදී.





සම්මුඛ පරීක්ෂණයෙන් සිසු සිසුවියන් 60 දෙනෙකු පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගන්නා ලදී අතර, අධ්‍යයන වර්ෂ 2022/23 සඳහා නවක සිසුන් බඳවාගැනීමේ උත්සවය 2022 මැයි මස 04 වැනි දින යාපනය සංදිලිපායී සංස්කෘතික මධ්‍යස්ථානයේ දී ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙදින මුඛ්‍ය දේශන යාපනය විවෘත විශ්වවිද්‍යාලයේ සහකාර අධ්‍යක්ෂ කේ. කන්දවේල්, උතුරු පළාත් සංස්කෘතික සහකාර අධ්‍යක්ෂ රාජමල්ලිකෙ සිවසුන්දර සර්මා හා ෂංමුගදාස් යන මහත්ම මහත්මීන් විසින් සිදු කරන ලදී.







ටවර් දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ දෙවන කළමනාකරණ මණ්ඩල රැස්වීම 2022.05.04 දින උතුරු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී පැවැත්විණි.





ටවර් දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ සිසු සිසුවියන් සඳහා නාට්‍ය හා රංගකලාව පිළිබඳ දෙදින ප්‍රායෝගික වැඩමුළුවක් 2022.05.05 හා 06 යන දිනයන්හි යාපනය සංදිලිපායී සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්වුණු අතර, එහි සම්පත්දායකත්වය දරනු ලැබුයේ අයුරන් හා තිලහනාදන් යන මහත්වරුන් විසිනි.





- **දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ සිසුන්ගේ අධ්‍යයන චාරිකාව**

2022 ජූලි මස 04 දින සිට 06 දින දක්වා දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ සිසුන් කේදීශ්වරම් කෝවිල වන්දනා මාන කිරීම සඳහා රැගෙන යන ලදී.





- **සාම්ප්‍රදායික සිංහල නර්තනය පිළිබඳ වැඩමුළුව (උඩරට නර්තනය)**

ටවර් දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2022/23 සිසුන් සඳහා ක්‍රියාත්මක කරන ලද සාම්ප්‍රදායික සිංහල නර්තනය පිළිබඳ වැඩමුළු මාලාවේ උඩරට නර්තනය පිළිබඳ වැඩමුළුව 2022 අගෝස්තු මස 11 සහ 12 දිනයන්හි යාපනය සංදිලිපායි සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. මෙදින සම්පත්දායකත්වය ජාතික අධ්‍යාපන ආයතනයේ නර්තන කථිකාචාර්ය ගීත් ප්‍රේමචන්ද්‍ර ද සිල්වා හා චන්න බුලත්සිංහල යන මහත්වරුන් විසින් ලබාදුන් අතර, සම්පත්දායක සහායක ලෙස බෙර වාද්‍ය ශිල්පී බී.ඒ.සී.ඩී. ජයවිලාල් මහතා සහභාගී විය.









- **විෂය බාහිර ක්‍රියාකරකම්**

ටවර් දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2022/23 සිසුන් සඳහා විෂය බාහිර ක්‍රියාකාරකමක් ලෙස නර්තනය හා සංගීත විෂයභාර ආචාර්යවරුන් විසින් නල්ලූර් කෝවිලේ පැවති ආගමික උත්සවයක් සඳහා 2022.08.23 දින සිසුන් සහභාගී කරවන ලදි.





- **දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2022/23 සිසුන්ගේ ප්‍රථම අධ්‍යයන වර්ෂ ප්‍රථම වාර ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම**

  ටවර් දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2022/23 සිසුන්ගේ ප්‍රථම වර්ෂ ප්‍රථම වාර ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු 2022.08.27, 28, 29 හා 31 දිනයන්හි පැවැත්විණි. මේ සඳහා සිසු සිසුවියන් 45 දෙනෙකු සහභාගී වූ අතර, ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය ලෙස කේ. කන්දවේල්, ශ්‍රී කණ්ණන්, වී. පවිත්‍ර හා කේ. රජීවන් යන මහත්ම මහත්මීන් සහභාගී විය.




දෙමළ නාට්‍ය හා රංගකලා පාසලේ සිසුන් සඳහා නොවැම්බර් මස 25 හා 26 දෙදින ශ්‍රී ලංකාවේ කීර්තිමත් නාට්‍ය අධ්‍යක්ෂවරයෙකු වූ මහාචාර්ය එස්. මවුනගුරු මහතා විසින් කූර්තු නාට්‍ය කලාව පිළිබඳ දෙදින ප්‍රායෝගික වැඩමුළුවක් පවත්වන ලදී.









➢ දෙමළ නිර්මාණවේදී ඇගයුම් උත්සවය හා සරස්වතී පූජාව

නාට්‍යවේදී අලවෙයුර් මුරුගයියා මහතා විසින් දශක හතරකට වඩා වැඩි කළක් දෙමළ නාට්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් සිදුකළා වූ මෙහෙවර වෙනුවෙන් එතුමාගේ නිර්මාණ ඇගයීමට ලක්කිරීම හා එතුමා වෙත උපහාර පිදීමක් 2022.10.05 දින යාපනය සංදිලිප්පායි සංස්කෘතික මධ්‍යස්ථානයේ පිහිටා ඇති ටවර් දෙමළ මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසලේ දී පවත්වන ලදී.

මෙදින මුඛ්‍ය දේශන උතුරු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ කොමසාරිස් සුජීවා මහත්මිය විසින් සිදුකරන ලද අතර, ටවර් දෙමළ නාට්‍ය පාසලේ සිසු සිසුවියන් විසින් ප්‍රාසංගික අවස්ථා ඉදිරිපත් කරන ලදී. මෙම උත්සවයට සමගාමීව එදිනම සරස්වතී පූජාව ටවර් දෙමළ නාට්‍ය පාසලේ දී පවත්වන ලදී.











- **පැරණි ගී ප්‍රසංග පැවැත්වීම**

ශ්‍රී ලාංකේය ජනතාවගේ රසවින්දනය උදෙසා පැරණි ග්‍රැමර්ෆෝන් ගීත, ජන නාට්‍ය ගී, ටීටර් ගීත, නූර්ති ගීත හා නාඩගම් ගී ඇතුළත් ප්‍රසංගයක් 2022.03.23 දින ස්වාධීන රූපවාහිනී සේවයේ ‘‘වෙනස’’ වැඩසටහන හරහා ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා ශිල්පීය ගෙවීම් හා සංග්‍රහ වියදම් පමණක් දැරීමට සිදුවිය.

මෙම අවස්ථාව සඳහා ගීත ගායනයෙන් ප්‍රවීණ නාට්‍ය ශිල්පීන් වන නිශ්ශංක දිද්දෙණිය, උදේනි චන්ද්‍රසිරි, රත්නශීලා පෙරේරා, සමන් ලෙනින්, චන්දි රණතුංග, නිලක්ෂි හැලපිටිය සහභාගී වූ අතර, වාදක මණ්ඩලය වෙනුවෙන් චමිල සංගීත්, නිමල්සිරි තෙබුවන, මහේන්ද්‍ර ගුණසිංහ හා නන්දන ගුණසිංහ සහභාගී විය. මෙහි සංගීත අධ්‍යක්ෂණය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහානාම වික්‍රමසිංහ විසින් සිදුකරන ලදී.













➢ ලෝක නාට්‍ය දින සැමරුම් උත්සවය

ජාත්‍යන්තර රංගකලා ආයතනයේ ශ්‍රී ලාංකේය නියෝජිතයා ලෙසින් ටවර් හෝල් රහහල පදනම වසර ගණනාවක් තිස්සේ ‘‘ලෝක නාට්‍ය දිනය’’ උත්සවාකාරයෙන් සමරනු ලබයි. මෙවර ලෝක නාට්‍ය දින සැමරුම් උත්සවය ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය, විදුර වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා සම්භාවනීය නාට්‍යකරුවන් රැසකගේ සහභාගීත්වයෙන් 2022 මාර්තු 27 වැනි දින පෙරවරු 9.30 ට සියවසක් සපුරමින් සිටින මරදාන එල්ෆින්ස්ටන් රහහලේ දී පැවැත්විණි.

මෙදින ‘‘නාට්‍යමය අවකාශයේ යථාර්ථය’’ මැයෙන් විශේෂ දේශනයක් ප්‍රවීණ නාට්‍යවේදී ජයන්ත චන්ද්‍රසිරි මහතා විසින් පැවැත්වූ අතර, ඇමෙරිකානු ජාතික පීටර් සෙලර්ස් (Peter Sellers) මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලෝක නාට්‍ය දින පණිවිඩය සිංහල භාෂාවෙන් රත්නා ලාලනී ජයකොඩි මහත්මියත්, දෙමළ භාෂාවෙන් පී. නිරෝෂන් මහතාත්, ඉංග්‍රීසි භාෂාවෙන් සමිත ජයනාත් බණ්ඩාර මහතාත් ඉදිරිපත් කරන ලදී.









- **සිංහල නාට්‍ය පිටපත් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම**

දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද, ප්‍රවීණ නාට්‍යවේදිනී සෝමලතා සුභසිංහ මහත්මියගේ ‘‘තොප්පි වෙළෙන්දා හා පුංචි අපට දැන් තේරෙයි’’ නාට්‍ය පිටපත් ද්විත්වය 2022.03.27 දින මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ දී එළිදැක්විණි. ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා විසින්සෝමලතා සුභසිංහ මහත්මියගේ දියණිය වන කෞෂල්‍යා ප්‍රනාන්දු මහත්මිය වෙත ප්‍රථම පිටපත් දිවිත්වය ප්‍රදානය කරන ලද අතර, දෙමළ මාධ්‍ය පාසල් කිහිපයක විදුහල්පතිවරුන් හා ටවර් හෝල් රඟහල පදනමේ භාරකාර මණ්ඩල සාමාජික හෂීම් ඕමාර් මහතා වෙත ද නාට්‍ය පිටපත් ප්‍රදානය කෙරිණි.







- **වියපත් ටවර් ශිල්පීන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය**

ටවර් හෝල් රහඟල පදනම මඟින් දීමනා ලබන වියපත් ශිල්පීන් 48 දෙනෙකු වෙනුවෙන් රු. 6000.00 ක වටිනාකමින් යුත් ත්‍යාග වවුචර් පිරිනැමීමේ උත්සවය 2022.04.08 දින ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා හා අමාත්‍යාංශ ලේකම් කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ටවර් හෝල් රහඟල පදනම ප්‍රධාන කාර්යාලයේ දී පැවැත්විණි.







➢ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය

අධ්‍යයන වර්ෂ 2014/15, 2015/16, 2016/17, 2017/18, 2018/19 සිසුන්ගේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2022.06.16 දින බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, සෝමරත්න විදානපතිරණ, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ද්විතීය හා තෘතීයික අධ්‍යනාංශයේ අංශාධිපති ශාමේන්ද්‍ර වනසිංහ, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ජාතික උරුම අංශයේ අතිරේක ලේකම් නිශාන්ති ජයසිංහ, සංස්කෘතික හා ප්‍රාසාංග කලා රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) එස්.ජී. පල්ලියගුරුගේ යන මහත්ම මහත්මීන්ගේ ප්‍රදානත්වයෙන් මරදාන එල්ෆින්ස්ටන් රහහලේ දී පැවැත්විණි. මෙදින ඩිප්ලෝමාලාභීන් 172 ක් වෙනුවෙන් ඩිප්ලෝමා සහතික ප්‍රදානය කෙරිණි. නීතීඥ ජෝන් ද සිල්වා ශිෂ්‍යත්වය, සී.දොන් බස්තියන් ජයවීර ශිෂ්‍යත්වය, නීතීඥ චාල්ස් ඩයස් ශිෂ්‍යත්වය, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ශිෂ්‍යත්වය වෙනුවෙන් සහ වසරේ දක්ෂතම ශිෂ්‍යයා, ශිෂ්‍යාව හා වැඩිම ලකුණු ලබාගත් ශිෂ්‍යයා වෙනුවෙන් අධ්‍යයන වර්ෂ පහ සඳහා පදක්කම් 35 ක් ප්‍රදානය කිරීම ද මෙහි දී සිදුවිය.







➢ ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2021/22 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් බඳවාගැනීම

ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2021/22 සඳහා නවක සිසුන් 50 දෙනෙකු බඳවාගැනීමේ උත්සවය 2022.08.01 දින මරදාන ටවර් රහහලේ දී බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රදානත්වයෙන් මරදාන ටවර් රහහලේ දී පැවැත්විණි.












- **ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2019/20 සිසුන්ගේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය**

අධ්‍යයන වර්ෂ 2019/20 සිසුන්ගේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2022.09.15 දින බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න, එම විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පීඨාධිපතිනි, ශෂිකලා කුගමූර්ති, අධ්‍යාපන පීඨයේ අංශාධිපති මහාචාර්ය ශමේන්ද්‍ර වනසිංහ, කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්, ආචාර් මණ්ඩලය, ඩිප්ලෝමාලාභී දරු දැරියන් හා ඔවුන්ගේ දෙමාපිය භාරකරුවන්, බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාශයේ ලේකම් සෝමරත්න විදානපතිරණ, එම අමාත්‍යාංශයේ උරුම අංශයේ අතිරේක ලේකම්, කේතඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ, අතිරේක ලේකම් (පාලන) එස්.ජී. පල්ලියගුරුගේ යන මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ දී පැවැත්විණි. මෙම උත්සවයේ මුඛ්‍ය දේශනය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න මහතා විසින් සිදුකරන ලදී.

මෙදින ඩිප්ලෝමාලාභීන් 37 දෙනෙකු වෙනුවෙන් ඩිප්ලෝමා සහතික ප්‍රදානය කෙරිණි. නීතීඥ ජෝන් ද සිල්වා ශිෂ්‍යත්වය, සී.දොන් බස්තියන් ජයවීර ශිෂ්‍යත්වය, නීතීඥ චාල්ස් ඩයස් ශිෂ්‍යත්වය, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ශිෂ්‍යත්වය වෙනුවෙන් සහ වසරේ දක්ෂතම ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව වෙනුවෙන් පදක්කම් පිරිනැමීමක් ද මෙහි දී සිදුකෙරුණි.









➢ ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගය පැවැත්වීම

අභාවයට යමින් පවතින අස්පර්ශ උරුමයන් නව පරපුරට දායාද කිරීමත්, ඒවා සංරක්ෂණය කිරීමත්, ප්‍රේක්ෂක රසවින්දනයත්, ටවර් හෝල් රහහල පදනමේ මුඛ්‍ය පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමත් අරමුණු කර ගනිමින්, ටවර් හෝල් රහහල පදනම විසින් සංවිධානය කළ ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය "ටවර් ප්‍රභාෂ්වර" ප්‍රසංගය 2022 දෙසැම්බර් මස 29 දින සවස 6.30 ට මරදාන එල්ෆින්ස්ටන් රහහලේ දී පැවැත්විණි.

මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා හා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය, විදුර වික්‍රමනායක මහතා ඇතුළු විශේෂ ආරාධිතයින් රැසක් සහභාගී විය.

























- **අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය “ටවර් නාට්‍ය උළෙල 2023“**

  පූර්ව කටයුතු සංවිධානය

අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය “ටවර් නාට්‍ය උළෙල - 2023“ වෙනුවෙන් නාට්‍යකරුවන්ගේ සහභාගීත්වයෙන් 2023.12.16 දින ටවර් හෝල් රහඟල පදනම ප්‍රධාන කාර්යාලයේ දී මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ලදී.

















මූදල් අංශය



ටවර් හෝල් රහහල පදනම

2022 වර්ෂය සඳහා වූ

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

130

මගේ අංකය / எனது இல. / My No. } CAA/D/THTF/01/2022/14

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 සැප්තැම්බර් 18 දින

අධ්‍යක්ෂ ජනරාල්

ටවර් හෝල් රහහල පදනම

ටවර් හෝල් රහහල පදනමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.යූ.ඒස්.ඒ. විජේකෝන්

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් - 1. ලේකම් - බුද්ධ ශාසන , සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

129

මගේ අංකය எனது இல. My No. CAA/D/THTF/01/2022/14 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 සැප්තැම්බර් 18 දින

අධ්‍යක්ෂ ජනරාල්
ටවර් හෝල් රහඟල පදනම

ටවර් හෝල් රහඟල පදනමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ටවර් හෝල් රහඟල පදනමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 80 (ඇ) ඡේදය ප්‍රකාරව වාර්තා කරන දිනෙන් පසු මාස 12 ක් ඇතුළතදී නිරවුල් කිරීමට නියමිත වගකීම්, ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවද 2023 වර්ෂයේදී විශ්‍රාම ගැනීමට නියමිත සේවකයින් තිදෙනෙකුට අදාළ රු.1,345,805 ක්වූ පාරිතෝෂික සඳහා වෙන් කිරීම්, ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි.

(ii) 2016 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබූ ප්‍රධාන කාර්යාලීය ඉඩම් හා ගොඩනැගිල්ල ඇතුළුව 2022 දෙසැම්බර් 31 දිනට පැවති වටිනාකම් රු. 942,000,000 ක් වූ පදනම් සතු ඉඩම් 03 ක් හා රු. 584,828,968 ක් වූ ගොඩනැගිලි 05 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(iii) සේවා කාලය වසර 05 සම්පූර්ණ නොවූ එහෙත් සමාලෝචිත වර්ෂය වනවිට අඛණ්ඩව මාස 12 ක කාලයක් සේවය කරන ලද සේවකයින්/ නිලධාරීන් දස දෙනෙකු වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 62 ඡේදය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා රු. 230,375 ක පාරිතෝෂික වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(iv) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 12 ඡේදය ප්‍රකාරව ක්ෂය කලහැකි වත්කම්වලට අදාල රාජ්‍ය ප්‍රදාන, අදාල වත්කම්වල ක්ෂය වියදමට සමානුපාතිකව කාල පරිච්ඡේදය තුල ලාභයට හෝ අලාභයට විලම්භිත අයභාරය ලෙස හඳුනාගත යුතු වුවත් පදනම විසින් සමාලෝචිත වර්ෂයට අදාල රු. 47,344,638 ක් වූ විලම්භිත අයභාරය වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

(ආ) ටවර් හෝල් රඟහල පදනම් සතු 2017 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.161,750,000 ක් වූ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල හා රු. 1,250,000 ක් වූ ශබ්දාගාරය වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළව ක්ෂය ගැලපීම් සිදු කර නොතිබීම හේතුවෙන් සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු. 81,500,000 කින් අඩුවෙන් හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ) ප්‍රවේණිගත වත්කම් 2020 වර්ෂයේ සිට ක්ෂය කරනු ලබන බවට වූ රහහලේ ප්‍රතිපත්තිය හා එල්ෆින්ස්ටන් රහහල නවීකරණය වෙනුවෙන් ප්‍රාග්ධනිත කරන ලද රු. 164,764,884 ක වියදමට අදාලව 2019 වර්ෂය වෙනුවෙන් රු. 16,476,488 ක් ක්ෂය ලෙස වෙන්කිරීම යන කරුණු අතර එකිනෙකට පරස්පරතා පැවති අතර ඒ අනුව ප්‍රවේණිගත වත්කම්වලට අදාල ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය නිවැරදි නොකිරීම හේතුවෙන් රහහල සඳහා වූ සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු.16,488,413 කින් වැඩියෙන් හා පදනමේ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි.

(ඈ) බදු පදනම මත ලබාගත් පිරිවැය රු.3,168,278 ක් වූ රුක්මණී දේවී රහහලේ කොටස වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය ප්‍රමාණය රු. 33,243 ක් විය යුතු වුවද එම වටිනාකම රු.316,828 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම හා 2022 දෙසැම්බර් 31 දිනට ක්ෂය වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු. 283,585 කින් වැඩියෙන් දැක්වුණි.

(ඉ) 2021 දෙසැම්බර් 30 දින පදනම් වෙත ලැබී තිබූ පිරිවැය රු.235,000 ක් වූ ලැප්ටොප් පරිගණකය 2021 වර්ෂයේදී ගිණුම්ගත නොකර 2022 වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණි.මේ හේතුවෙන් 2022 ජනවාරි 01 දිනට පරිගණක උපකරණ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණු අතර මෙම පරිගණකය වෙනුවෙන් 2022 වර්ෂයට අදාළව ක්ෂය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය ද රු.47,000 කින් අඩුවෙන් දැක්වුණි.

(ඊ) **පාරිතෝෂික ගෙවීම්**

(i) 2022 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.23,196,800 ක් වුවද, ඊට අනුරූපී ස්ථාවර තැන්පතුවල ආයෝජන වටිනාකම රු.20,752,432 ක් විය.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව පාරිතෝෂික ගෙවීම් රු. 1,642,130 ක් ලෙස දක්වා තිබුණද වර්ෂය තුල ගෙවූ පාරිතෝෂික වටිනාකම රු. 1,709,865 ක් වූයෙන් පාරිතෝෂික ගෙවීම් රු. 67,735 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(උ) සංචිත ගිණුමට ගැලපීම් කර තිබූ වත්කම් ප්‍රත්‍යාගණනය මත ජනිත වූ ලාභ, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් නොවන නමුත් 2022 වර්ෂයේදී වාහන ප්‍රත්‍යාගණනය තුලින් ජනිත වූ රු.34,670,000 ක ලාභය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(උ) ස්ථාවර තැන්පතු හා පොලී ආදායම

(i) 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සංචිත යටතේ ප්‍රසාංගික කලාකරුවන් සඳහා වූ ජනාධිපති සුභසාධන අරමුදල් ශේෂය රු.60,399,700 ක් වුවද අදාල සුභ සාධක අරමුදල නමින් වූ ස්ථාවර තැන්පතු වටිනාකම රු.70,999,700 ක් විය. ඒ අනුව අරමුදලේ ශේෂය රු.10,600,000 ක් අඩුවෙන් දැක්වුණු අතර ඒ සඳහා හේතු අනාවරණය නොවීය.

(ii) ටවර් වෘත්තියාභිමුඛ සංසදය අරමුදල් ශේෂය රු.276,900 ක් වුවද අදාල අරමුදල නමින් වූ ස්ථාවර තැන්පතු මුදල රු.100,000 ක් විය. ඒ අනුව අරමුදලේ ශේෂයට සාපේක්ෂව තැන්පතු මුදල රු.176,900 ක් අඩුවෙන් ආයෝජනය කර තිබුණු අතර මේ පිළිබඳ පූර්ව වර්ෂ විගණන වාර්තා මඟින්ද පෙන්වා දී ඇතත් මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනය අනුව ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 22,010,386 ක් වුවද උපලේඛනය අනුව පොලී ආදායම රු.21,461,065 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර රු.549,321 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iv) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම රු. 14,082,645 ක් වුවද, 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.14,202,278 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 119,633 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) වසර ගණනාවක් තිස්සේ ගිණුම්වලින් ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.79,368,600 ක් වූ ශේෂයන් පිළිබඳ තොරතුරු/ ලිපිගොනු/ ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‌නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඒ) 2022 ජනවාරි 01 දිනට ජර්නල් වවුචරයක් මඟින් ගිණුම්වල ආරම්භක ශේෂ ඉදිරියට ගෙන ඒම සිදුකළ යුතු වුවද පදනම් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා

පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 පදනමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් පදනමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් නැබීම් හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ 1.2 (ආ), (ඌ)i,

(ඌ) ii, සහ (එ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් වීනොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

නීති,රීති/ යොමුව	විධානයට	විස්තරය
(අ)	සවිසිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම වෙත පවරාදීමට අදාල 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන්	i. මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත් එම කාර්යයන් සඳහා නොයෙදවන ලද්දේ නම් එවිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණද පදනම සතු සවිසිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අවස්ථා 02 කදී වසර 30 බැගින් බදු දී තිබුණි.
		ii. විධිමත් අනුමැතියකින් හා විධිමත් පත්වීමක් නොලද අධ්‍යක්ෂ ජනරාල්වරයකු අත්සන් තබන ලද නීත්‍යානුකූල නොවන ලිඛිත බදු ගිවිසුමක් මගින් වසර 30 ක කාලයක් සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට නැවත බදු දීම සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 13 දිනැති අංක CAA/A/THTF/2021/05/Q10 දරන විගණන විමසුමට අදාළව 2023 ජනවාරි 09 දිනැති පිළිතුරු ලිපියෙන් පදනමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම වරද නිවැරදි කරන බව දක්වා තිබුණද එසේ නිවැරදි කිරීමට කටයුතු සිදුකර නොතිබුණි.

iii.පදනම විසින් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සමග ඇති කරගත් මූලික බදු ගිවිසුමේ, බදු ගැනුම්කරුවන්ට සම්පූර්ණ බදු දේපල හෝ ඉන් කොටසක් හෝ අතුරු බදු දීමට බලය ඇත්තේය, යන ලෙස කොන්දේසි ඇතුළත් වගන්තියක් පදනමට අවාසි වන අයුරින් ඇතුළත් කිරීම හේතුවෙන් එම අධිකාරිය විසින් වර්ග අඩි 2017 ක වපසරියක් 2021 ජූලි 01 දින සිට 2023 ජූනි 30 දින දක්වා කාලපරිච්ඡේදයට ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) වෙත රු.227,000 ක මාසික කුලියකට අතුරු බදු දී තිබුණි. තවද එම අධිකාරියට බදු දී තිබූ ගොඩනැගිල්ලට අයත් ශ්‍රවණාගාරයද කුලී පදනමට බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි.

(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/ 2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 04 ඡේදය	පිළියෙල කර තිබූ පදනමේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුල පුනරාවර්තන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.
(ඇ)	2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය .	කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද පදනම විසින් 2022 වර්ෂයට අදාල ගිණුම් 2023 මැයි 19 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.3 වෙනත් කරුණු

(අ) 1978 අංක 01 දරන ටවර් හෝල් රහඟල පදනම් පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) **ජනාධිපති සුභසාධක අරමුදල**

(i) ජනාධිපති සුභසාධක අරමුදල පිහිටුවීම සම්බන්ධයෙන් වූ 1996 මාර්තු 21 දිනැති අංක: අමප/96/0672/103/013 ක් වූ සංදේශයට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මෙම අරමුදල වෙනම ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස ඇති

කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් ටවර්හෝල් රහහල පදනමේ කොටසක් වශයෙන් කරගෙන යා යුතු බවත් දන්වා තිබියදී ඊට පටහැනිව පදනමේ භාරකාර මණ්ඩලය විසින් අරමුදල වෙනුවෙන් වෙනමම කළමනාකරණ මණ්ඩලයක් පත්කර රු. 1,000 බැගින් වූ මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. 2017 වර්ෂයෙන් පසු කළමනාකරණ මණ්ඩලය පත් කිරීමට අදාල තිරණය ක්‍රියාත්මක කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලය දැනුවත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) අවශ්‍ය අතිරේක මුදල් ප්‍රමාණය සපයා ගැනීම නව උපාය මාර්ගයක් මඟින් සිදුකළ හැකි බව සඳහන් කරමින් රු. 3,000 ක් ව පැවති විශ්‍රාම වැටුප් දීමනාව රු. 7,500 ක් දක්වා වැඩි කිරීමට අංක 2019/294/03/01 දරන භාරකාර මණ්ඩල පත්‍රිකව මඟින් අනුමැතිය ලබාදී තිබුණද විගණිත දින වන විටත් කිසිදු නව උපාය මාර්ගයක් හඳුනාගෙන නොතිබුණු අතර මේ හේතුවෙන් 2022 වර්ෂය සඳහා ජනාධිපති සුබසාධක අරමුදලේ රු.7,435,500 ක් වූ දීමනා ගෙවීමට අරමුදලේ තැන්පතු පොලී ආදායම ප්‍රමාණවත් නොවීම මත අවස්ථා 07 කදී පදනමේ අංක 2327541 දරන ජංගම ගිණුමෙන් රු.1,816,000 ක මුදලක් ලබාගෙන තිබුණි.

(iii) රු.3,000 ක්ව පැවති දීමනාව රු.7,500 දක්වා වැඩි කිරීම හේතුවෙන් දැනට අරමුදල සිටින ප්‍රතිලාභීන්ටද ප්‍රතිලාභ ගෙවීමේ දුෂ්කරතාවලට මුහුණ දී තිබුණු අතර 2014 වර්ෂයේ සිට අයදුම්පත් යොමුකරන ලද ප්‍රාසාංගික කලාකරුවන් 50 කට වැඩි ප්‍රමාණයකට විශ්‍රාම දීමනා ලබා ගැනීමට නොහැකිව වසර ගණනක් පොරොත්තු ලේඛනයේ රැඳීසිටීමටද සිදුව තිබුණි. මෙම අරමුදල සම්බන්ධයෙන් නිවැරදි තීරණ නොගැනීම හා අරමුදල නිසි ලෙස කළමනාකරණය කිරීමට පියවර නොගැනීම හේතුවෙන් ජනාධිපති සුභසාධක අරමුදල පිහිටුවීම මඟින් අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට පසුගිය වර්ෂ කිහිපය තුලදීම පදනම අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) **කාර්යය මණ්ඩල බඳවාගැනීම්**

(i) පදනමේ බඳවාගැනීමේ පරිපාටියට පටහැනිව "නඩත්තුකරු" තනතුර සඳහා සුදුසුකම් සපුරා නොමැති "Automobile Engineering" පිළිබඳ NVQ 4 මට්ටමේ සුදුසුකමක් සහිත තැනැත්තෙකු මෙම තනතුර සඳහා බඳවාගෙන

2022 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු. 105,780 ක වැටුප් හා දීමනා ගෙවා නිබුණි.

(ii) බදගැනීමේ පරිපාටියට අනුව රංගාලෝක ශිල්පී සහායක තනතුර සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක රංගාලෝක ශිල්පය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා නිබිය යුතු වුවත් අවශ්‍ය සුදුසුකම් සපුරා නොනිබුණු නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන 2022 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රු. 208,674 ක වැටුප් හා දීමනා ගෙවා නිබුණි. තවද සේවා පළපුරුද්ද පිළිබඳ කිසිදු නොරතුරක් අයදුම්පත්වල සඳහන් කර නොනිබුණු හා සේවා පළපුරුද්ද සනාථ කෙරෙන කිසිදු සේවා සහතිකයක පිටපතක් ඉදිරිපත් කර නොනිබූ මෙම අයදුම්කරුවන් දෙදෙනාට සේවා පළපුරුද්ද වෙනුවෙන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ද ලබාදී නිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති



ටවර් හෝල් රහතල පදනම

2022 වර්ෂය සඳහා වූ

අවසන් මූල්‍ය ප්‍රකාශය

ටවර් හෝල් රඟහල පදනම
2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2022 රුපියල්	2021 රුපියල්
වත්කම්			
ජංගම වත්කම්			
අතැති මුදල් සහ බැංකු ශේෂය	6	10,744,583	1,397,386
ඉන්වෙන්ටරි	9	2,706,926	2,715,953
තැන්පතු	7	158,000	158,000
පෙරගෙවුම්	7	872,156	427,006
වසරක් ඇතුළත ලැබිය හැකි ආපදා ණය	7	2,851,208	2,633,047
අත්තිකාරම්	7	7,445,191	8,213,892
ණය ගැතියන්	8	4,513,400	2,455,957
වෙනත් ලැබිය යුතු දේ	8	423,914	679,792
ආයෝජන - THT සහ TRT	10	135,568,211	124,568,211
ආයෝජන - PWF	10	70,999,700	70,999,700
මුළු ජංගම වත්කම්		**236,283,289**	**214,248,944**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	11	1,518,531,327	1,550,262,090
කෙරෙමින් පවතින වැඩ - RDMC		-	274,303
කෙරෙමින් පවතින වැඩ - "සරසවිපාය" ප්‍රතිසංස්කරණය		-	4,736,893
කෙරෙමින් පවතින වැඩ - "ටවර් හෝල්" ප්‍රතිසංස්කරණය		-	-
වසරකට පසු ලැබිය යුතු ආපදා ණය	7	2,579,218	6,694,250
මුළු ජංගම නොවන වත්කම්		**1,521,110,545**	**1,561,967,536**
මුළු වත්කම්		**1,757,393,834**	**1,776,216,480**
බැරකම්			
ජංගම බැරකම්			
ණය දෙන්නන් හා උපචිත වියදම්	12	14,328,505	8,995,909
අත්තිකාරම් වශයෙන් ලැබුණු මුදල්	13	1,631,015	824,750
ආපසු ගෙවීමට ඇති තැන්පතු	14	2,005,300	789,300
මුළු ජංගම බැරකම්		**17,964,820**	**10,609,959**
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන		23,196,800	23,343,775
මුළු ජංගම නොවන බැරකම්		**23,196,800**	**23,343,775**
සම්පූර්ණ බැරකම්		**41,161,620**	**33,953,733**
ශුද්ධ වත්කම්		**1,716,232,214**	**1,742,262,747**
ශුද්ධ වත්කම් / ස්කන්ධ			
සමුච්චිත අරමුදල	15	96,347,725	131,654,669
සංචිත			
රජයේ ප්‍රදානය		1,000,000	1,000,000
රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය		260,307,909	288,723,166
ජනාධිපති සුබසාධන අරමුදල		60,399,700	60,399,700
මුදල් පරිත්‍යාග		18,577,319	18,577,319
කරුණාසහගත පරිත්‍යාග		58,890,541	58,890,541
වාහන පරිත්‍යාග		2,975,000	-
දිවංගත රුක්මණී දේවි අරමුදල		21,176	21,176
වත්කම් නැවත තක්සේරු කිරීම	16	1,216,450,453	1,181,780,453
නාට්‍ය සහ රංගකලා ශිෂ්‍යත්ව අරමුදල		382,828	336,161
ශිෂ්‍යත්ව අරමුදල		602,665	602,665
ටවර් සංගීත සමූහ රඟහල අරමුදල		276,900	276,900
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධ		**1,716,232,214**	**1,742,262,747**

පිටු 05 සිට 23 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අන්වාර්ය අංගයකි.
මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම ටවර් හෝල් රඟහල පදනමේ සාමාජිකයින් හට පැවරේ.

මණ්ඩලයේ සාමාජිකයන් සඳහා සහ වෙනුවට

....

එස්.කේ දේශප්‍රිය — සහකාර අධ්‍යක්ෂ (මුදල්)
ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක — අධ්‍යක්ෂ ජනරාල්
සාමාජික — භාරකාර මණ්ඩලය
සාමාජික — භාරකාර මණ්ඩලය

ටවර් හෝල් රඟහල පදනම
විස්තීරණ ආදායම් ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

	සටහන්	2022 රුපියල්	2021 රුපියල්
ආදායම			
එකතු කළා:			
රජයෙන් ලද ප්‍රදාන - පුනරාවර්තන වියදම්		62,595,000	55,000,000
මෙහෙයුම් ආදායම	1	18,807,506	5,027,482
පොලී සහ වෙනත් ආදායම්	2	22,865,217	12,826,706
වැඩසටහන් ආදායම	2	10,055,375	14,709,640
		114,323,098	87,563,827
වියදම්			
අඩු කළා:			
පරිපාලන සහ ආයතනික වියදම්	3	174,873,034	137,172,874
ප්‍රවර්ධන සහ සුබසාධන වියදම්	4	20,183,111	27,567,160
මූල්‍ය සහ වෙනත් වියදම්	5	59,835	68,280
		195,115,980	164,808,315
ආදායම ඉක්මවූ වියදම		**-80,792,883**	**-77,244,487**

ටවර් හෝල් රඟහල පදනම
